**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - 2017**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ **ව්‍යාපෘතියේ** 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 - එල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුලත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කලමනාකරණය පිලිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ ඵලදායීතාවය හා කාර්යසාධනය පාදක මාර්ග කොන්ත්‍රාත්තු ආකෘතිය භාවිතා කරමින් ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) දුර ප්‍රමාණයක් සැලසුම් කිරීම, ඉදිකිරීම, නඩත්තු කිරීමේ ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක කිරීමයි. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 18,125 කට සමාන වි.ගැ.හි 90.5 (එ.ජ.ඩොලර් මිලියන 125) ක් වූ අතර සම්පූර්ණ වටිනාකම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2026 ජූනි 30 වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත

සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය දෙන ආයතන වලින් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්වාගණන විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මාර්ග ආංශික සහයෝගිතා ව්‍යාපෘතිය විසින් මෙම ව්‍යාපෘතියේ උපදේශක සේවා, සමාජ බලපෑම් තක්සේරු කිරීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැසුම පිළියෙල කිරීම, පරිශීලක තෘප්තිමත් භාවය ඇගයීම හා ඉඩම් අත්පත්කර ගැනීම ආදිය සඳහා දරා තිබුණු රු. මිලියන 140.21 ක වියදම ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ArcGIS මෘදුකාංග පැකේජ 2ක් වැඩිදියුණු කිරිමට සහ නඩත්තු කිරිම සඳහා රු.මිලියන 5.75 ක් 2017 පෙබරවාරි 28 දින ව්‍යාපෘතිය දරා තිබූ අතර එසේ මිලදීගත් මෘදුකාංග එදිනම මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. කෙසේවෙතත් ඒ සඳහා දැරූ පිරිවැය ව්‍යාපෘතියේ වත්කමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

### 3.1 අරමුදල් උපයෝජනය

---

ණය ගිවිසුමේ සඳහන්ව ඇති තොරතුරු අනුව රු.මිලියන 18,125 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 125 ක ප්‍රමාණයක් ප්‍රතිපාදනය කර තිබුණු අතර එයින් ප්‍රවර්තන වර්ෂය තුළ වියපැහැදම් ගෙවීම් සිදුකර නොතිබුණි. තවද, රේඛීය අමාත්‍යාංශය යටතේ ප්‍රවර්තන වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ශ්‍රී ලංකා රජයේ දායකත්වය වශයෙන් රු.මිලියන 580 ක් ලබා දී තිබූ අතර ඉන් රු.මිලියන 63.79 ක මුදලක් පමණක් වර්ෂය අවසානය වන විට භාවිතා කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, වත්කම් කළමනාකරණය සහ මාර්ග නඩත්තු කටයුතු වලට සහය කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 5.75 ක වියදමක් දරා පරිගණක මෘදුකාංග පැකේජ 2 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කටයුතු කර තිබූ අතර, එම පරිගණක මෘදුකාංග 2017 පෙබරවාරි 28 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි. ඊට අමතරව ව්‍යාපෘතිය විසින් පැලියගොඩ - පුත්තලම මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමට කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතුද ආරම්භකර තිබුණි. නමුත් පැලියගොඩ - පුත්තලම මාර්ගයේ පුනරුත්ථාපනය කරන අංශයට අදාල පරිශීලක තෘප්තිමත්භාවය ඇගයීම, ධාරිතාව වර්ධනය හා පුහුණු කිරීම, ඉඩම් අත්පත්කර ගැනීම ආදී ව්‍යාපෘතියට අදාල අනෙකුත් කටයුතු 2017 දෙසැම්බර් 31 වන විටත් ආරම්භකර නොතිබුණි.

(ආ) ණය ගිවිසුමේ දෙවන උපලේඛනයේ අ වගන්තිය ප්‍රකාරව, ව්‍යාපෘතියේ කටයුතු සඳහා මගපෙන්වීම ලබාදීම හා සමස්ථ ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවේ වගකීම වේ. කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

-----------------------------------

ව්‍යාපෘතිය විසින් රු.මිලියන 5.75 ක වියදමක් දරා ArcGis මෘදුකාංග පැකේජ 2 ක් වැඩිදියුණු කිරීම සඳහා තරගකාරී ලංසු තබන්නන්ගේ මිල ගනන් නොකැඳවා බලයලත් නියෝජිතයින් මගින් පමණක් සෘජුවම මිල ගණන් කැඳවීමට කටයුතු කර තිබුණි. තවද මෙම කාර්යය සඳහා ණය ගිවිසුම මගින් ප්‍රාග්ධන අයිතම් සපුරාගැනීමට ප්‍රතිපාදනය කර තිබූ අරමුදල් භාවිතා නොකර ඒ වෙනුවට රේඛීය අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ අධීක්ෂණ වියදම් වෙනුවෙන් ලබා දී තිබූ අක් මුදල් මෙම කාර්යය සඳහා භාවිතා කර තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

ලැබී ඇති තොරතුරු අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලයට පුද්ගලයන් 22 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේවෙතත් ප්‍රවර්තන වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘති ඉංජිනේරු, ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ නිළධාරි, ප්‍රසම්පාදන විශේෂඥ සහ පරිසර සහ සමාජ ආරක්ෂණ නිලධාරි යන ප්‍රධාන තනතුරු 2017 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

**3.5 ඉඩම් අත්පත් කරගැනීම් සහ නැවත පදිංචි කිරීමේ කටයුතු**

----------------------------------------------------------------------

මීගමුව, වෙන්නප්පුව, මහවැව සහ හලාවත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලට අයත් ඉඩම් කැබලි 193 ක් අත්පත් කර ගැනීම සඳහා හඳුනාගෙන තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ඉඩම් කැබලි අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භකර නොතිබුණි.